# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.23 පැය 1250 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/817 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශය.**

කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන විමර්ශනය කරන ලද සැකකරුවෙකුගෙන් අනාවරණය කර ගන්නා ලද තොරතුරු මත 2025.04.22 වන දින රාත්‍රී කාලයේ මරදාන පොලිස් වසමේ බි.සී.සී පාලම අසලදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 222 මිලිග්‍රෑම් 330 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගන්නා ලද මෙම සැකකරුගෙන් අනාවරණය කර ගන්නා ලද තොරතුරු අනුව කොටහේන පොලිස් වසමේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 109 මිලි ග්‍රෑම් 240 ක් සමඟ සැකකරුවෙකු හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 44 මිලි ග්‍රෑම් 870 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මරදාන පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 හා 30 යන වයස් වල පසුවන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

**කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**